## 2.46 මහනුවර නාථ දේවාලයේ ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණවලින් පිළිබිඹු වන දේශීයත්වය.

අනුරුද්ධිකා දිල්හානි[1]
ඉතිහාසය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

### ABSTRACT

සෙංකඩගල සිරිවර්ධනපුර නමින් ප්‍රචලිත වූ මහනුවර රාජධානිය පිහිටුවා ගැනීම පිළිබඳව ඉතිහාසය ක්‍රි.ව. 1357 දී ගම්පොළ රාජධානිය කොටගෙන සිටි III වික්‍රමබාහු රජු විසින් ඉදිකළ බව මූලාශ්‍රවල සඳහන් වේ. මහනුවර නගරය ආරම්භ වීමේ ඉතිහාසය පරීක්ෂා කර බලන්නෙකුට නාථ දේවාලය ඇසුරින් ලැබෙන තොරතුරු එහිලා, බෙහෙවින්ම උපකාරී කර ගත හැකි ය. මහනුවර නගරය සැලැස්මට අනුව නාථ දේවාලය කන්ද උඩරට රාජ්‍යයේ පළමු ඉදි කිරීම ලෙස සඳහන් කළ හැකි ය. සෙසු ස්මාරක හා ගොඩනැගිලි නාථ දේවාලයට වඩා පසුකාලීන ඉදි කිරීම් වේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ මහනුවර නාථ දේවාලයේ දක්නට ලැබෙන දේශීය හා විදේශීය ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ අතුරින් දේශීය ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ වෙන්කොට හඳුනා ගැනීමය. මෙහි දී මා විසින් භාවිතා කරනු ලබන පර්යේෂණ ක්‍රමවේදය වන්නේ සමකාලීන වෙනත් වාස්තු විද්‍යාත්මක නිර්මාණ සමග සංසන්ධනාත්මකව දත්ත විශ්ලේෂණය කිරීමය.

ගෘහ නිර්මාණ ශිල්පය පරිපූර්ණ වීමට නම් කිසියම් ප්‍රමාණයකට සියලු කලාවන්ගේ සම්මිශ්‍රනය වීමක් අවශ්‍ය වේ. එවකට විසූ කලාකරුවා මේ කලා නිපුණතාවය අඩුවක් නොමැතිව පෙන්වූ බවට නාථ දේවාලය කදිම නිදසුනකි. නාථ දේවාලයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ විමසීමේදී මධ්‍යකාලීන අවධියේ බෙහෙවින් ම ජනප්‍රිය වූ ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමා ගෘහයකට සමාන බව පැහැදිලිය. පොළොන්නරුවේ තිවංක පිළිමගෙය, ගඩලාදෙණිය මේ සඳහා දිය හැකි කදිම නිදසුන් වේ. ඒවායේ දැකිය හැකි මණ්ඩපය, අන්තරාලය, ගර්භ ගෘහය, යන ප්‍රධාන අංග නාථ දේවාලයේ ආකෘතිය සඳහා පදනම් වී ඇති බව පෙනේ. එමෙන්ම නාථ දේවාලයේ ගෘහ නිර්මාණ ලක්ෂණ තුළින් බහු සංස්කෘතික සම්බන්ධතාවක් පෙන්නුම් කරයි. එනම් බෞද්ධ සංකල්ප හා දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ මනාව සුසංයෝජනය කරමින් දේශීයත්වය ඉස්මතු වන ආකාරයට හැඩ ගස්වා තිබීම යි.

නාථ දේවාලයේ මණ්ඩපය, අන්තරාලය, යන අංගද්වය දකුණු ඉන්දියාවේ කෛලාසනාථ සහ වෛකුණ්ඩපෙරුමාල් යන දේවාලවල ද දැකිය හැකිය. නාථ දේවාලයේ ගර්භ ගෘහයේ පරිපූර්ණත්වය ඇති කරන්නා වූ ත් ඊට බෞද්ධ ස්වරූපයක් ආදේශ කරන්නා වු ත් ප්‍රධානතම කොටස එහි තෘතිය මාලකයයි. එම තෘතිය මාලකය බුබ්බුලාකාර ගර්භයෙන් යුත් ස්තූපයක ආකෘතියක් සිහි ගන්වයි. නාථ දේවාලයට දේශීයත්වය ආරෝපණය කිරීම සඳහා ත් දකුණු ඉන්දීය දේවාල ස්වරූපය සම්පූර්ණයෙන් ම මතුවීම වැලැක්වීම උදෙසාත් මෙම අංග එක් කළා විය යුතු ය. මහනුවර නාථ දේවාලයේ හින්දු ගෘහ නිර්මාණ ලක්ෂණ අතර බෞද්ධ සංකල්පය පිළිඹිබු වන ගෙඩිගේ නිර්මාණය තුළින් බහු සංස්කෘතික සම්බන්ධතාවක් පෙන්නුම් කරයි. මේ අනුව නාථ දේවාලයේ ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ වලින් පිළිබිඹු වන දේශීයත්වය පිළිබඳව කරුණු ගෙනහැර දැක්වීම මාගේ අරමුණයි.

**Key words:** මහනුවර නාථ දේවාලය, ගෘහ නිර්මාණ ශිල්පය.